**ශීර්ෂ 321 - නැගෙනහිර පළාත් සභාව - 2025**

----------------------------------------

## 1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

සතුට සමගිය සහ යහපාලනය සමගින් තිරසාර සංවර්ධනයක් සඳහා සමෘද්ධිමත් පළාතක්.

### 1.2 මෙහෙවර

සැමට තිරසාර සාමයක් සමඟ දිළිඳුකම පිටුදැකීමට, සංවර්ධන ප්‍රතිලාභ සහභාගීත්ව පදනමකින් සමසේ බෙදී යන, සමාජ ආර්ථිකය ශක්තිමත් වන යුක්ති සහගත සම්පත් කළමනාකරණයක් සහ යහපාලනයක් තුලින් සමෘද්ධිමත් පළාතක් ලෙස නැගෙනහිර පළාත පරිවර්තනය කිරීම.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයේ නවවන උපලේඛනයේ පළාත් සභාවල බලතල හා කාර්යයන් දක්වා ඇති අතර පළාත් සභාවලට පවරා ඇති විෂයයන් 37 ක ලැයිස්තු 1 අනුව කටයුතු කිරීම.

## 2. මූල්‍ය ප්‍රකාශන

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

නැගෙනහිර පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 60,053.00 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 57,310.90 ක් උපයෝජනය කර තිබිණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,742.10 ක් හෙවත් සියයට 4.57 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2025 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | (%) |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 51,303.00 | 49,490.00 | 1,813.00 | 3.53 |
| මූලධන | 8,750.00 | 7,820.90 | 929.10 | 10.62 |
| **එකතුව** | **60,053.00** | **57,310.90** | **2,742.10** | **4.57** |

## 3. විගණන නිරීක්ෂණ

පාර්ලිමේන්තුව විසින් ශීර්ෂය යටතේ ලබාදුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනය කර තිබුණි. පළාත් සභා අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.